| | |
|---|---|
| | මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය- 2016 |
| | Primary Piriven Mid-Year Term Test - 2016 |
| | 3 වසර / Grade 3 |
| සියලු ම හිමිකම් ඇවිරිණි) All Rights Reserved) | සිංහල Sinhala — කාලය : පැය තුනයි Time : Three hours |

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න හයකට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 200කට නො අඩු රචනයක් ලියන්න.

i. අනුරාධපුර පූජා නගරය.
ii. වාරියපොළ ශ්‍රී සුමංගල නාහිමි.
iii. පරිසරය සුරැකීම අපගේ යුතුකමකි.
iv. සිරිපා කඳු මුදුනේ දී.
v. ඩෙංගු උවදුර පිටුදකිමු. (ලකුණු 25)

02. (අ.) නිපාත පද සහ උපසර්ග පද හඳුන්වන්න. (ලකුණු 05)
(ආ.) නෛපාතික කෘදන්ත (නිපාත ක්‍රියා) යනු මොනවාද ? (ලකුණු 05)
(ඇ.) ඌෂ්මාක්ෂර ලියා දක්වන්න. (ලකුණු 05)

03. (අ.) පහත දැක්වෙන වචනවල ස්ත්‍රීලිංග පද ලියන්න.
i. රජු
ii. අශ්වයා
iii. කුකුළා
iv. බමුණා
v. කොටියා (ලකුණු 05)

(අ.) හිස්තැනට ගැළපෙන අකුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. ..... නිජ (ඛ , ක)
ii. ..... ණ්ඨාරය (ග , ඝ)
iii. ..... ණ්ඩාගාරික (බා , භා)
iv. ..... ෂ්ටාචාරය (ශි , සි)
v. ..... තකරණය (සී , ශී) (ලකුණු 05)

(ඇ.) පහත සඳහන් එක් පදයක් සඳහා එක් වාක්‍ය බැගින් නිර්මාණය කරන්න.

i. කම්කරුවා
ii. භික්ෂුව
iii. නළුවා
iv. ගොවියා
v. සඳ (ලකුණු 05)

04. (අ.) පහත සඳහන් විසන්ධි පද සන්ධි කර දක්වන්න.

i. සුර + අත
ii. ඔවුන් + ඔවුන්
iii. සුර + අඟන
iv. මැද + ඇඟිල්ල
v. යන + එන (ලකුණු 05)

(ආ.) සමාස වර්ග පහ නම් කර එක් එක් සමාසයකට එක් උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 05)

(ඇ.) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියාපදයක් යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. මව සහ දුව මල් ................................
ii. දෙමව්පියෝ අප ................................
iii. මව විසින් දරුවන් ................................
iv. මට ඔබේ ලිපිය ................................
v. පරිවේණාධිපති හිමියෝ ශිෂ්‍යයන් ................................ (ලකුණු 05)

05. (අ.) "වඳුරු" ශබ්දය සියලු විභක්තිවල වරනගන්න. (ලකුණු 05)
(ආ) පූර්වක්‍රියාව සහ මිශ්‍රක්‍රියාව උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)
(ඇ.) වර්ගාක්ෂරවලට අයත් නාසික්‍ය අක්ෂර දක්වන්න. (ලකුණු 05)

06. " මිනිස් ජීවිතයට ගත හැකි ආදර්ශ රැසක් උම්මග්ග ජාතකයේ පවතී " ඔබ උගත් කථා ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

07. "බුදුගුණඅලංකාර කතුවරයා බුදුගුණ වැනීමට දක්ෂයෙකි" මෙතෙක් උගත් කවි ඇසුරින් මෙම කියමන සනාථ කරන්න. (ලකුණු 15)

08. "උපදේශාත්මක කෘතියක් ලෙස " වනකතා" අගය කිරීම වටී." ඔබ උගත් මුල්කථා ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15)